# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1992/9 - 2016 නොවැම්බර් මස 07 වැනි සඳුදා - 2016.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2016 නොවැම්බර් මස 08 වැනි දින සිට ආරම්භ වන මාස 06ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතුය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2016.07.18 දිනැති අංක 1976/4 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මුං ඇට (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0713.31.19) සහ 2016.05.20 දිනැති අංක 1967/57 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් මාළු (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 03.02 සහ 03.03) සඳහා ප්‍රකාශිත අදාළ නියමයන් 2016 නොවැම්බර් මස 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 01. | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 75 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේගු සං.ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 75 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |


1A - PG 3235 — 532 (2016/11)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 02 | 07.13 | 0713.31.19 | අනෙකුත් - මුං ඇට | කි. ග්‍රෑමයට රු. 40.00 |
| 03 | 08.04 | 0804.50.50 | මැංගුස්ටීන් - අළුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| | | 0804.50.60 | මැංගුස්ටීන් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 04 | 08.05 | 0805.10.20 | දොඩම් - වියළි | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 05 | 08.08 | 0808.30 | පෙයාර්ස් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| 06 | 08.09 | 0809.29 | අනෙකුත් - චෙරීස් | කි. ග්‍රෑමයට රු. 250.00 |
| 07 | | 0809.40 | ප්ලම්ස් සහ ස්ලෝස් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 08 | 08.10 | 0810.50 | කිවිප්රුට් | කි. ග්‍රෑමයට රු. 175.00 |
| 09 | | 0810.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |

12 - 25

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.